
# ලෝක සචාරිය




එච්.පී.ජී.දිනිති මනීෂා ජයලත්

# ලෝක සවාරිය

එච්. පී.ජී.දිනිති මනීෂා ජයලත්
කතෘ

වෙනත් කෘති
උඩියටිකුරු දේශය

මහමායා බාලිකා විද්‍යාලය
8E
2025.02.22

ISBN
978-624-208-822-8

# පිදුම

අම්මාටත් , අප්පච්චීටත්,මල්ලීටත්

උපදෙස් දුන් සියලුම ගුරු මෑණිවරුන්ටත්

පියවරුන්ටත්, අදහස් දුන් යෙහෙලියන්ටත්

දිරිය දුන් සැමට

තුති පුදමි.

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනිමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතිත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **"හෙරණගත්කරණී"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රිය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දිමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජිවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සදහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

# නිවාඩුව පටන්ගෙන...

" ජේන්...ජේන් ඔයා දැන් පැය කීයක් නිදිද ඉක්මනට නැඟිටින්න බලන්න ඉර පායලත් එක්ක"
නිවාඩු කාලයේ පළමු දිනයේ උදෙන්ම ජේන්ගේ සවනට ඇසුණේ ඇගේ මවගේ හඬයි.
" හරි අම්මා ......මම....නැඟි..ටින....වා..ආ
අද නම් හොඳට නිදාගත්තා කාලෙකට පස්සේ"
නිදි මරමින් කුස්සියට ගිය ජේන් තේ කෝප්පය අතට ගනිමින් තම මවගෙන් මේසේ ඇසුවාය.
" ඒක නෙවෙයි අම්මා අයියා කොහේද ගියේ
මං නැගිටින කොට එයා හිටියේ නෑනේ" " අයියද..
.....එයා ඉතින් ඔයා වගේ දවල් වෙනකන් නිදාගන් නැතුව උදේම නැගිටලා පීටර්ලාගේ ගෙදර ගියා ......මං හිතන්නේ නිවාඩු කාලේ යන චාරිකාව ගැන කතා කරන්න වෙන්නැති" තාච්චියට බිත්තරයක් දමමින් මව පැවසුවාය.

ඉන තෙක් දික් වූ කළු කෙස් කලඹක් ඇති තලලු පාට අවුරුදු දහයක් පමණ වයස ඇති දැරියගේ දුඹුරු දෑස් දිලිසුනේ චාරිකාව
යන වචනය ඇසෙත්මය. " චාරිකාව.....හනේ අම්මා මං ඉක්මනට හෝදගෙන එන්නම් උදේ කෑමට කළින් මට පොඩි ලිපියක් අරින්න තියෙනවා." යමක් මතක් වූවාක් මෙන් මවට එසේ පවසා ජේන් නාන කාමරයට දිව ගියාය.

" ආ....මොනවා කලත් උදේ කෑමට එන්න ඕනෑ . අයියත් දැන් එයි" එසේ පවසා සෙසිමාන් මහත්මිය තාච්චියට තවත් බිත්තරයක් දැම්මාය. එවිටම සෙසිමාන් මහතා පත්තරය රැගෙන කෑම මේසයේ ඉඳගත්තේය.
" හම්මා .......අද නම් පත්තරය උදෙන්ම හම්බුනා" " අද පත්තර ගේන කෙනා කලින් මං හිතන්නේ" සෙසිමාන් මහත්මිය කීවාය. " ඔව්...ඔව්..." යැයි පවසා සෙසිමාන් මහතා පත්තරයට තම දෑස යොමු කලේය. එවිටම කුස්සියේ දොර ඇරුණි. " අම්මා....තාත්තා.... දන්නවද මේ....අපි නිවාඩුවට ට්‍රිප් යන්නේ කොහෙද කියල " උදේම පීටර්ලගේ ගෙදර ගිය බිල් නිවසට පැමිණියේ තමාගේ අලුත් ආරංචිය සමග ය. තලලු පාට,දුඹුරු ඇස් ඇති,ලප පිරුණු මුහුණකින් යුතු ,ඉතා උස බිල් පීටර්ගේ හොඳම මිතුරා විය. දෙදෙනාටම වයස අවුරුදු දොලහක් විය.බිල්ගේ කටහඬ ඇසුණු සැනින් තැපැල් කන්තෝරුවට ගොස් පැමිණෙමින් සිටි ජේන් කුස්සියට දිව
" බිල්...... ඔයා ආවද ....කියන්න අපි ට්‍රිප් එක යන්නේ කොහෙද"
"අපි යන්නේ පැරිසියේ" බිල් තම ආරංචිය වචන තුනකින් කීවේය. " පැරිසියේ ......මරු......මේක තමා මං යන හොඳම ට්‍රිප් එක" ජේන් සතුටින් නටන්නට වූවාය." නිවාඩුවක් ගතකරන්න කියාපු තැන" සෙසිමාන් මහතා පත්තරය පසෙකින් තබමින් පැවසුවේය
"හරි...හරි..ඔක්කොම කාලා ඉන්නකෝ දැන්" මව
එම ආහාරය ඉතා රසවත් විය. අලුත් ආරංචිය සමග එහි රස තවත් වැඩිවිය. ආහාර ගැනීමෙන් පසු සෙසිමාන් මහතා තම අත් ඔරලෝසුව දෙස බැලුවේය. " හපෝ..යි

හොඳටෝම පරක්කුයි මේ නිවාඩුවේ වනෝද්‍යානයට මිනිස්සු එනවත් වැඩියි..." බිල් හා ජේන්ගේ පියා වූ සෙසිමාන් මහතා වනෝද්‍යානය ක පශු වෛද්‍යවරයෙකි.

" බායි....තාත්තා පරිස්සමින් ගිහින් එන්න" ජේන් බෙරිහන් දුන්නාය. " තාත්තා..... රෝරිගේ තාත්තාව හම්බුනොත් අපි යන්නේ පැරිස් කියලා කියන්න....මට ඉස්කෝලෙදී එයාට චාරිකාව යන තැන කියන්න බැරිවුණා" බිල් ද ජේන් නොදෙවනිව කෑගැසුවේය. " බායි...බායි ළමයි මතක් වුණොත් කියන්නම් බිල්...යනවා ලිලී" සෙසිමාන් මහතා කාරයට දිව යමින් කීවේය. "හොඳයි පරිස්සමින්" මව ද කාරයට නගිමින් සිටි පියාට අත වනමින් කෑගැහුවාය.දරුවන් සමග අත වැනීමෙන් පසු මව කුස්සියට ගියාය. " අම්මා....අපි ඔයාට පිඟන් හෝදන්න උදවු කරන්නම්" කියූ බිල් ජේන් සමග එක්ව මවට පිඟන් සේදීමට උදවු වූහ.

" අම්මා.....නිවාඩුව වුණාට තාත්තාට නිවාඩු නැනේ" ජේන් තමා හෝදමින් සිටි පිඟන් සෝදා අවසන් වූ පසු මවගෙන් ඇසුවේ තම දෙහි ලෙල්ලක් වන් මුහුණට හේතුව බිල් ඇසූ විටය. " මේකනේ ජේන් වනෝද්‍යානයේ සත්තු ලෙඩ වෙනකොට බෙහෙත් දෙන්නේ තාත්තානේ ඉතින් සත්තු කවද කොයි වෙලාවේ කොහොම ලෙඩ වෙයි ද කියල දන්නේ නෑනේ...ඉතින් තාත්තා හැම වේලාවකම වගේ එතන ඉන්න ඕනේ" මව දැරියට ආදරයෙන් පැහැදිලි කලාය.

" ඒ වුණාට ඒක හරිම විනෝද රස්සාවක් සත්තු එක්ක කාලය ගත කරන්න පුළුවන් ඒක හරිම විනෝදජනකයි මාත් දවසක තාත්තා වගේ වෙනවා" බිල් කීවේ ජේන්ගේ සිත හදන බලාපොරොත්තුවෙනි. "ඇයි මතක නැද්ද ගිත නිවාඩුවට ට්‍රිප් එක ගියෙත් අපි වනෝද්‍යානයටනේ" බිල් නැවත කෑ ගැහුවේ පරණ මතක අලුත් කරමිනි.

" හරි හරි.......ඔය දෙන්නා උදවු කරා ඇති දැන් ඔය පිඟන් දෙක තියලා යන්න... මං හිතන්නේ අද වගේ ලස්සන දවසක ගේ ඇතුලේ ඉන්න එක හෝද මදි " මව පැවසුවේ දරුවන්ට අලුත් අදහසක් දෙමිනි.

" ඔව්...අම්මේ ඒක නම් හොද අදහසක්....ඒත් අපි මොනවද කරන්නේ"බිල් සිතන්නට විය. ජේන්ට අදහසක් පහල විය. "අපි ටෙනිස් ගහමු" " ඔව් ඔව් අපි ටෙනිස් ගහමු.." ඉතින් ඔවුන් දෙදෙනා ටෙනිස් පිති ගැනීමට දිව ගියහ.

ජේන් හා බිල් පාසලේ දක්ෂ ටෙනිස් ක්‍රීඩකයෝය.

"ඇත්තටම බිල් දැන් අපි ට්‍රිප් එක යන්නේ කවදාද" ටෙනිස් පිති අතට ගනිමින් ජේන් ඇසුවාය. "ම්ම්.....මං හිතන්නේ මේ මාසේ තුන් වෙනි සතියේ" "අයියෝ තව ගොඩක් කල් තියෙනව"

# ජේන්ට අනතුරක්...

එය සැබැවින්ම හිරු බබලන ප්‍රීතිමත් දිනයකි.තම ටෙනිස් පිති ද රැගෙන බිල් හා ජේන් වත්තට ඇවිද ගියෝය.

" ඔන්න එහෙනම් මං පටන්ගන්නවා" කියමින් ජේන් බෝලය උඩ දමා පහරක් එල්ල කලාය.බිල් තම නැගණියට දෙවනි නොවී තමා වෙත පැමිණි බෝලයට ප්‍රති පහර එල්ල කලේය.

" ඒක නෙවෙයි ජේන් මට ඔයාට කියන්න අමතක වුණා පීටර්ගේ අම්මයි තාත්තයි හිතන් ඉන්නේ මේ මාසේ තුන් වෙනි සතියේ බ්‍රහස්පතින්දා පැරිස් කෞතුකාගාරයේ පැවැත්වෙන මහා සමුළුවට සහභාගිවීමට එයාලා දක්ෂ පුරාවිද්‍යානයෝ " යැයි අයියා නගෝ ටෙනිස් තරගය අතරතුර බිල් කීවේය.

"හානේ ඒක කොච්චර හොඳද අපිට එතකොට ශ්‍රේෂ්ඨ පුරාවිද්........"

අවාසනාවකි.ජේන්ට තමා කියූ දෙය අවසන් කිරීමට නොහැකි විය. ඇගේ සතුට නිසා ඇයට තමා ටෙනිස් ක්‍රීඩා කරන බව අමතකව ගොස් තිබුණි.

" ආව්.....මගේ අත" ටෙනිස් බෝලය කෙලින්ම ඇගේ අතට පතිත වී තිබුණි. "අනේ....මගේ අත" යැයි කෑ ගසමින් බිම ඉඳගත්තාය.

"අනේ.....මට සමාවෙන්න මොකද වුණේ ගොඩක් රිදෙනවද " තම ටෙනිස් පිත්ත බිම දමමින් දිව ආවේය.

"මොකද වුණේ ජේන් ..ඔයා කෑ ගහනවා මට කුස්සියට ඇසුණා" ජේන්ගේ කෑ ගැහිල්ල ඇසුණු මව ද වහා දිව ආවාය. "අම්මා ....ජේන් හරියට බලාගෙන හිටියේ නෑ බෝලේ ගිහින් එයාගේ අතේ වැටුණා." බිල් නිදහසට කරුණු කීවේය. මව විගස දිව විත් තුවාලය පිරික්සුවාය.

"දැන් ඉතින් මොනව කරන්නද ....බයවෙන්න එපා ජේන් බරපතල තුවාලයක් වෙලා නෑ චුට්ටී තැල්මක් සතියකින් දෙකකින් හරියයි දැන් නැගිටින්න ඕක උනු වතුරෙන් තවමු" කියූ සෙසිමාන් මහත්මිය ජේන්ව නැඟිටවා කාමරයට එක් කරගෙන ගියාය. පසුව අත තැවුවේය.එය කකියමින් තිබිණ. "අනේ ඒක රිදෙනවා"ජේන් කෙඳිරි ගෑවේය. "මීට වඩා අවධානය යොමු කරන්න ජේන්" "හොදයි"සිහින් හඩින් ජේන් කීවාය.

“හොද වෙලාවට වම් අත” අත වෙලුම් පටිවලින් ඔතා අවසන් වූ පසු මව පැවසුවාය. මෙතෙක් වෙලා නිහඬව සිටි බිල් ජේන්ගේ සිත සැනසීමට මේසේ කීවේය. “ ඕක ඉක්මනට හරියයි පීටර්ගේ කකුලේ බෝලේ වැදිල සතියකින් හොද වුණා” බිල් වගේම පීටර් ද පාසලේ දක්ෂ ටෙනිස් ක්‍රීඩකයෙකු විය. “අනේ මේක හරියට රිදෙනවා.ට්‍රිප් එක යද්දිවත් හොද වෙලා තිබුණොත් හොදයි” ජේන් වෙලුම් පටිවලින් ඔතන ලද තම අත දෙස බැලුවාය” එදින සියලුම කටයුතු සදහා ජේන්ට මවගේ සහය අවශ්‍ය විය. ඇයට අවශ්‍ය විට උදවු කිරීමට බිල් ද ඉදිරිපත් විය. මැණික්කටුව ලගින් සිදුවී ඇති තැල්ම නිසා ඇයට අත සෙලවීමේදී දැඩි වේදනාවක් දැණින. වේදනාව මොහොතකට හෝ අමතක කර ගැනීමට කතන්දර පොතක් කියවීමට ජේන් වගබලාගත්තාය.රාත්‍රි කෑම මේසේදී සෙසිමාන් මහතා මේසේ පැවසුවේය. “මීට වඩා සැලකිලිමත්ව ක්‍රීඩා කරන්න ජේන් .දැන් ඉතින් මොනව කරන්නද. ඕක ඉක්මනට අඩුවෙයි.හැබැයි ඉතින් වේදනාව දරාගන්න වෙයි” “ආය මීට වඩා සැලකිලිමත් වෙන්නම්” ජේන් සිහින් හඩින් කීවාය. “මං කෝකටත් ලූසිගේ අම්මට කතා කලා.එයා මට බෙහෙත් වගයක් කීවා වේදනාව අඩුවෙන්න” මව පැවසුවාය. ලූසි ජේන්ගේ හොඳම යෙහෙළියයි.ඇගේ මව වෛද්‍යවරියකි.

* * * * * *

ඉදිරි සතියම ජේන්ට අපල විය. දවසම කාමරයට වී සිටින්නට විය. එක් දිනක් ඇයට සතුටු උදාවිය.දීප්තිමත්ව හිරු පායා තිබුණු එදින අගහරුවාදාවකි. උදෑසන ඇහැරුණු බිල් හා ජේන් මුහුණ කට සෝදා ඇදුම් ඇදගත්හ. ජේන්ට තම වැඩ ටික කරගැනීමට බිල්ගේ මෙන්ම මවගේ ද උදවු අවශ්‍ය විය.උදේ ආහාරය රැගෙන කාමරයට ගිය ජේන්ට මවගේ හඩ ඇසුණි.

“ජේන් බලන්න කවුද ඔයාව බලන්න ඇවිත් තියෙන්නේ කියලා” මවගේ හඩ ඇසුණු සැණින් පඩිපෙල දිගේ පහළට දිව ගිය ජේන්ගේ මුහුණෝ සතුට ඉතුරුවේය. “හනේ…. ලූසි ඔයා ආවද” ඒ ලූසි විය.ඇය ජේන් බැලීමට ඇවිත් තිබුණි.ඇගේ අතේ තරමක් ලොකු පෙට්ටියක් තිබුණි.

# ටෝෆු....

"ඔයා ආපු එකනම් ලොකු දෙයක් ලූසි බිල් බයිසිකල් පදින්න ගිය නිසා මම නිකම් හිටියේ ආ..... ඔයාට මගේ ලියුම හම්බවුණාද?" ජේන් ලූසිව කාමරයට ඇතුළු කරගනිමින් කියාගෙන ගියාය."ඔව් මට පෙරේදා හම්බුනා.....ඒ වගේම මට හරිම කණගාටුයි ඔයාගේ අතට වෙච්ච දේ ගැන"ලූසි දුක් මුසු ස්වරයකින් කීවාය. " දැන් ඉතින් මොනවා කරන්නද ඒක නේමේ මොකක්ද ඔය පෙට්ටියේ තියේන්නේ" ජේන් කුතුහලයෙන් ඇසුවාය. "ඒකද..... ඔයාම ඇරලා බලන්නකෝ" ඇය ජේන් දෙසට කඩදාසි පෙට්ටිය දිගු කළාය.ජේන් පෙට්ටිය සෙමෙන් විවෘත කළාය. "ඤාව්..." සිහින් හඬක් ඇසුණි. ජේන්ගේ දෑස දිලිසුණි."හනේ.....කිටි පැටියෙක්" ජේන් කෑගැසුවාය. "මට මෙයාව හම්බුණේ ඔයා බලන්න එනකොට හන්දියේ ටෝෆු* කඩේ පිටිපස්සේ මේ පෙට්ටියත් එක්කම" ලූසි පූස් පැටියා අතගාමින් කීවාය.
"මේ කිටි බබාගේ නම මොකක්ද" ජේන් ඇසුවාය. "මං තව හිතලත් නෑ" "මොකද හිතන්නේ ටෝෆු කිව්වොත් එයා ටෝෆු කඩයක් ළඟ දී නේ හම්බුනේ" ජේන් අදහසක් දුන්නාය. "ඔව් ඒක තමා හොඳම නම ඔයා කැමතිද පැටියෝ ඒකට" කියමින් ලූසි ටෝෆුගේ ඔළුව සෙමින් පිරිමැද්දාය. පූස් පැටියා එයට කැමතියි කියන්නාක් මෙන් ලූසිගේ අතේ ඇතිල්ලුනාය. "ටෝෆු ඔයාට අපිත් එක්ක ට්‍රිප් එක යන්නත් පුළුවන්"ජේන් පූස් පැටියා දෙස බලමින් කීවාය. "ආ.....ඔයා කියද්දී තමයි මතක් වුණේ අපි ට්‍රිප් එක යන්නේ කොහෙද?" ලූසි ඇසුවාය. "අපි යන්නේ පැරිස් ලූසි" " ඇත්තටම ඒක නම් කියලා වැඩක් නෑ ඔයා දන්නවද පැරීසිය තමයි ආදරණීයම රටවල් අතරේ ඉස්සරහින්ම ඉන්නේ" ලූසි සතුටින් ඉතිරි ගියාය. "ඇයි ඒ විතරද අයිෆල් ටවර් එක, චීස්.....ආ තව අපි ලෝක ප්‍රසිද්ධ පැරිස් කෞතුකාගාරයටත් යනවලු"ජේන් ද සතුට ගලමින් සිටියාය. "යේ...අපි පැරිස් යනවා......චීස් කනවා...ලලල ලලා ලා ලා..."



ටෝෆු*- සෝයා කිරිවලින් සකසන ලද ආහාරයක්

# යන්න පුලුවන්ද.....

ජේන් හා ලූසි සින්දු කියමින් නටන්නට වූහ.ජේන්ට තම අත පිලිබද සම්පූර්ණයෙන්ම අමතක විය.කිසි දෙයක් නොදත් ටෝෆු වටපිට බලන්නට විය.

" ජේන් ලූසි ඔයාලා උඩද ඉක්මනට පහලට එන්න" ජේන්ගේ මවගේ හඩ ඇසුණි. " ආ.....අපේ අම්මා කතාකරනවා තේ හදලා ඇති යමු පහලට" ජේන් ලූසිව ඇදගෙන පඩිපෙල දිගේ පහළට දිව ගියාය.පහල සාලයට යන විට දුටු දෙයින් මවිත විය. බිල් අම්මා තාත්තා, පීටර් හා ඔවුන්ගේ දෙමව්පියන් ද,ලූසීගේ මවද සාලයේ සිටියහ. "මේක කිව්වා කියල දුක් වෙන්න එපා ජේන්"සෙසිමාන් මහතා යමක් කීමට උත්සාහ කළේය. ජේන් හා ලූසි අන්දුන්කුන්දුන් වී බලා සිටියහ.

" සමාවෙන්න ජේන් මේ අවුරුද්දේ ට්‍රිප් එක යන්න වෙන්නේ නෑ"

"මොකක්...නෑ" සෙසිමාන් මහතා කී දෙය ඇසුණු ජේන් හා ලූසි එකවර කෑ ගැසුවෝය. " ඒත්.....ඇයි..ඇ...යි යන්න වෙන්නේ නැත්තේ" ලූසි විසල් දෑසින් ඇසුවාය. පීටර්ගේ මව කතා කරන්නට විය. "ඇත්තෙන්ම කිවුවොත් ජේන්,ලූසි අපි හිතන් හිටියේ පැරිස්
කෞතුකාගාරයට යන්නනේ ඒත් එයලගේ වාර්ෂික මහා සමුළුව මේ සිකුරාදට දාලා අනික ඒ සමුළුව ඉවර වුණ ගමන් එයාලා කෞතුකාගාරය අලුත්වැඩියාවකට වහනවා ආය අරින දවසක් කියල නෑ සමුළුව දවස කලින් වැටුන නිසා අපිට යන්න වෙන්නේ නෑ" "ඉතින් ඇයි හෙට යන්න බැරි ...අනිද්දා.....එහෙමත් නැත්නම් ඉන් අනිද්දා අපිට බඩු පැක් කරන්න එච්චර කල් යන්නේ නෑ" ලූසි කෑ ගසන්නට විය. ඇය හා ලූසි නැටූ සතුට දැන් බිදී ගොස්ය. ජේන් නැවත කෑ ගසන්නට විය. " අනේ ඇයි ....බැරි"දැඩි නිහඬබවකි.ඇගේ ඇස්වලින් කදුලු බේරෙන්නට ලංවී තිබුණි.

"ජේන් පුතේ .....මේ අහන්නකෝ" සෙසිමාන් මහත්මිය යමක් කීමට උත්සාහ කලාය. " ජේන් ඔයාගේ අත ...." මව බොහොම අමාරුවෙන් කීවාය. ජේන්ට ඇඬෙන්නට විය.ඇය කිසිවිටෙක මෙය බලාපොරොත්තු වූයේ නැත. " ඒකට කමක් නෑ...මට ය...න්න පුළුවන්" ජේන් අඩන්නට විය. මව සනහන්නට උත්සාහ කලාය. "ඕ...ජේන් අඩන්.." "බෑ මට යන්න

ඕන…නැත්නම් මං ආය ටෙනිස් ගහන්නේ නෑ"ජේන් අඩමින් කාමරයට දිව්වාය. " ජේන්….නවතින්න"මව කෑගැසුවාය. " අනේ අයරින් උදව් කරන්න" සෙසිමාන් මහත්මිය ලූසීගේ මව වූ අයරින් මහත්මියට කීවාය. ඇය වෛද්‍යවරියකි. "අම්මා….නංගී කියපු දෙයක් නොකර ඉන්නේ නෑ" බිල් කීවේය. " අනේ…ජේන් ලබන අවුරුද්දේ ජාත්‍යන්තර තරගවලට යන්න ඉන්නේ" මව පැවසුවාය. "මුකුත් විදිහක් නැතිවෙයිද" ජේන්ගේ පියාද ඇසුවේය.ලූසීගේ මව අන් අයගේ මැසිවිලි අතරේ පිලිතුරු දුන්නාය. "ඇත්තටම දැන් සතියක් විතර ගිහින් හින්ද එයාට යන්න බැරිවෙන එකක් නෑ, අපි පොඩ්ඩක් පරීකෂා කරලා බලමු හැබැයි පීටර්ගේ දෙමව්පියන්ට ජේන් ගැන සැලකිලිමත් වෙන්න වෙයි. " ඒක ප්‍රශනයක් නෑ"පීටර්ගේ මව බ්‍රවුන් මහත්මිය කීවාය.

කාමරයට දිව ගිය ජේන් හැඩීමට වූවාය. ඇගේ හීනය බොදවී ගොස්ය. කාමරයේ දොර ඇරුණී. "ජේන් ඔයාට වාරිකාව යන්න……………….. පුළුවන්" අයරින් මහත්මිය ජේන්ගේ මව සමග පැමිණියෝය. " හැබැයි….ඔයා ඔයාගේ අත බලාගන්නවා කියලා පොරොන්දු වෙන්න ඕන" ජේන්ගේ දෑස් දිලිසුණී. " ඇත්තටම….ඔව් මං පොරොන්දු වෙනවා" " ඔයා ආයමත් ටෙනිස් ගහනවා නේද" ජේන්ගේ මව සැකයෙන් ඇසූවාය. "ඔව් අනිවාර්යයෙන්ම "

* * * * * *

බදාදා දවස පුරා ජේන් ,බිල්,ලූසි,පීටර් දවස් තුනකට අවශ්‍ය ඇදුම් පැලදුම් සූදානම් කලෝය.එදින ඔවුන් කාර්ය බහුල විය. බදාදා රාත්‍රියේ ගුවන් ගමන තිබූ අතර රාත්‍රි 7.00 නිවසින් පිටවීමට තිබුණි.

" ජේන් .......ඔයාගේ අතේ ගාන බාම් එක ගත්තද" සෙසිමාන් මහත්මිය ඇසුවාය. "ඔව්..ඔව් අම්මා" "මතක තියාගන්න ජේන් ඔයාගේ විශ්වාසය හින්දයි ඔයාව යවන්නේ.....හැම වේලාවකම පරිස්සම් වෙන්න" " හරි හරි අම්මා මං පරිස්සම් වෙන්නම්" ජේන් අම්මාව බදාගනිමින් කීවාය. " ඒක නෙවෙයි......පීටර් අද හය වෙද්දි එනවා කිව්වා" බිල් කීවේය. " ආ....එහෙනම් මම කෑම බීම ටික හදන්නම් ඔයාලා බඩු ටික ලෑස්ති කරන්නම්" මව එසේ පවසා කුස්සියට ගියාය.

## පැරීසිය.....

" වාව්.....මං කවදාවත් හිතුවේ නෑ අයිෆල් කුලුන මෙච්චර ලස්සන ඇති කියල" පීටර් කීවේය. " ඔව් ඇත්ත තමයි" ලූසි තම පූස් පැටියා දෑතට ගනිමින් කීවාය.

බිල්,ජේන්,ලූසි හා ටෝනු ,පීටර් හා පීටර්ගේ දෙමව්පියන් පෙර දින උදෑසන වන විට ගුවන් ගමන අවසන් කර තම නවාතැන්පලට පැමිණියහ.සියලු දෙනාම හෙම්බත් වී සිටි නිසා ආහාර ගත් විගස ඇදට වැටුනෝය.පසු දින උදෑසනම ඔවුහු අයිෆල් කුලුන නැරඹීමට ගියෝය.

" මට නම් හරිම සතුටුයි...එන්න ලැබීම ගැන මම හිතුවේ මගේ අත හින්ද එන්න බැරිවෙයි කියල" ජේන් අයිෆල් කුලුන දෙස බලමින් කීවාය. " හරි......හරි දැන් කොහොම හරි ආවනේ දැන් ඉක්මන් කරමු කෞතුකාගාරයේ සමුළුව පටන් ගයි" බිල් කීවේය. " ළමයි අපි යනවා ඉක්මනට එන්න" පීටර්ගේ පියා බ්‍රවුන් මහතාගේ හඩ ඇසුණි. " එනවා තාත්තේ" පීටර් කෑගැසුවේය. " ඒක නෙවෙයි මට හොද අදහසක් ආවා" කෞතුකාගාරයට යන අතරතුර ජේන් කීවාය. " ඒ මොකක්ද" " මේකයි දැන් සමුළුව තියෙන්නේ කෞතුකාගාරයේ එලියේනේ.... ඒ වෙලාවේ හැමෝම එලියේනේ ඉතින් අපිට පුළුවන් කවුරුත් නැතුව නිදහසේ මීට කෞතුකාගාරයම බලන්න" ජේන් කියාගෙන කියාගෙන ගියාය. "ඔව්මයි ඒක නම් මාර අදහසක්" බිල් තම ප්‍රසාදය එල කරේය. " ඒ වේලාවට අම්මයි තාත්තයි කොහොමත් එයාලගේ යාලුවෝ එක්ක කතා කරන නිසා කිසි ප්‍රශ්නක් නැතිව අපිට ඇතුලට යා ගන්න පුළුවන්" පීටර්ද එකතු

වුණෝය. " රහස් මෙහෙයුමට ජය වේවා!" ලූසී කෑ ගැසුවාය. " කෑ ගසන්න එපා ලූසි බ්‍රවුන් මහත්මයාටයි මහත්මියටයි ඇහුණොත් යන්න බැරිවෙයි. එයාලා හිතයි අපි අතින් පෞරාණික භාණ්ඩවලට හානියක් වෙයි කියල" ජේන් ලූසිට වැලමිටෙන් ඇන කීවාය. ටෝෆුද උනන්දුවෙන් ළමුන් වටා කැරකුනේ ළමුන්ගේ වැඩ තේරුම් ගත්තාක් මෙනි.

ඔවුහු අයිස්ක්‍රීම් කමින් ඉදිරියට ඇවිද ගියෝය. කෙමෙන් කෙමෙන් ඔවුන් කෞතුකාගාරයට ළඟා විය.එය ලොකු බිම් කොටසකට අයත් ගොඩනැගිල්ලකි.එහි පැරිස් කෞතුකාගාරය ලෙස විශාල රිදී අකුරෙන් ගසා තිබිණ.එලිය මිදුල කොටසෙහි පුටු දමා සමුළුවට අවශ්‍ය ලෙස වේදිකාවක් ද සකස් කර තිබිණ. " කොහොම ද මිස්ටර් බ්‍රවුන් ඇන්ඩ් මිසිස් බ්‍රවුන්" කළු කෝට් එකක් හැදගත් මහත්මයෙක් කීවේය. බිල් පීටර්ගේ වැලමිටට ඇන රහසින් " මේක තමා හොදම වේලාව" යැයි කීවේය. " අම්මේ.....තාත්තේ අපි පොඩ්ඩක් ඇවිදලා බලලා එන්නම්" පීටර් ආයාචනාත්මක හඩින් ඇසුවේය. " හොදයි ...හොදයි ඕන එකක් පරිස්සමින් විශේෂයෙන් ජේන්........" " හරි අම්මා ස්තූතියි"

ඔවුන් එතනින් පැනගෙන ඉක්මනින් කෞතුකාගාරයේ ප්‍රධාන දොරටුව අසලට ගියහ.එය විශාල දොරටුවකි.එය තරමක් ඇරී තිබුණි. ළමයි හතරදෙනා හා පූසා හෙමින් ඇතුලට ගියහ."මගේ දෙවියනේ" ජේන්ගේ කට ඇරුණි.

# පැරිස් කෞතුකාගාරය...

කෞතුකාගාරයට ඇතුලු වූ විටම විශාල ඩයිනෝසර ඇටකටුවක් තිබිණ. එය කෞතුකාගාරයේ වහලේ ගෑවීමට ඔන්න මෙන්න විය. " මං කවදාවත්ම මෙච්චර ලොකු එකක් දැකල නැහැ" පීටර් විස්මිත කීවේය. "ඕ..ටෝනු බයවෙන්න එපා ඒක බොරු එකක්" ලූසි තම කකුල් අතරේ ගුලි වූ පූස් පැටියාට කීවාය. ඒසේ කීවද ඌ එය අසලින් යන විට ඇත් වීමට කටයුතු කලේය." හැමෝම ඉක්මනට යං තව ගොඩක් බලන්න තියෙනවා" පීටර් වට පිට බලන ගමන් කීවේය.

එහි විවිධ ආකාරයේ පෞරාණික භාණ්ඩ තිබුණි.විවිධ රටවල කාසි,ප්‍රසිද්ධ චිත්‍ර ආදියද තිබුණි. එම පෞරාණික භාණ්ඩවලට නම , එහි වැදගත්කම, ඒවා අයිති යුග යටින් තිබුණි. සියලු දෙනාම විවිධ කෞතුක භාණ්ඩ බලමින් එහි වැදගත්කම කියෙව්වාය.එක් ස්ථානයක තිබූ පූස් අනුරුවක් දැක ටෝනු එය සමග කතා කරන්නාක් මෙන් ඤාව්..ඤාව්..ඤාව් ගෑවේය.

"ටෝනු ඔය පිලිමෙට කතා කර කර ඉන්නේ නැතුව එන්අන" ලූසි කෑගැසුවාය. " මං හරි ආසයි ලෝකේ වටේ යන්න" ජේන් ලූසිට කීවාය. " හ්ම්....මාත්" ලූසි කීවාය.

" හැමෝම අහගන්න ඔය තියෙන පිලිම අල්ලන්න එපා" පීටර් නායකත්වය ගනිමින් කීවාය.

# අද්භූත පිලිමය.....

"අර බලන්න අර පිලිමය" බිල් ඇඟිල්ල දික් කරමින් යමක් පෙන්වූවේය. එය දේවදූතයෙකුගේ පිලිමයකි.එය හතර කොණින් වට කර තිබුණි.එහි බඩ මැද හිලකි. එහි කිසිදු විස්තරයක් නොතිබුණි. " ඒක මැද හිලක්" " ඔව්මයි" ජේන් පුදුම විය. " බිල්........ කන්න වගේ ඕක දිහා බලාගෙන ඉන්නේ ඕන් නැති වැඩ කරන්න එපා" පීටර් කීවේය. එය ගණනකට නොගත් බිල් " අනේ මුකුත් වෙන්නේ නෑ"

කීවේය. " බිල් ඔයා මොනව හරි කරද්දි අපිට කියන්න ඔයාගේ හිනාව මට අල්ලන්නේ නෑ.......ඒත් මට මේ හිල ඇතුලේ හුරුපුරුදු තැනක් පේනවා" බිල් පිලිබද හොද හැටි අද්දැකීම්

ඇති ජේන් සැකයෙන් යුතුව කීවාය. "ටෝෆු.....කොහෙවත් යන්න එපා" කියමින් ලූසි ඌව දෑතට ගත්තාය.

කුඩා නිහඬ බවකි. එක පාරටම බිල් " මං මේ හිල ඇතුළට දානවා විතරයි" කියමින් එම හිල ඇතුළත ඇඟිල්ල දැම්මාය .

එවිටම සුදු ආලෝකයක් විහිදුණි. සියලු දෙනාම කුණාටුවකට කැරකී ගියේය.හිතන්නවත් වේලාවක් නොතිබුණ.ජේන්ගේ බඩ තද විය.

# ඊජිප්තුව ....අපොයි නෑ

ඔවුහු කැරකී ගොස් බිමට වැටුණෝය.නමුත් වැටුණේ පෙර සිටි තැනට නොවේ. " අපි මේ කොහෙද ඉන්නේ" බිල් ඔලුව අතගාමින් ඇසුවේය. "මෝඩයා...කිව්වා ඕන් නැති වැඩ කරන්න එපා කියල" පීටර් ඇනුම් පද කීවේය.

" ආව්......අනේ" ජේන් කෑගැසුවාය. " ආ...ජේන් ඇයි"

" මගේ අත වැටෙද්දී.....වැදිලා ගොඩක් රිදෙනවා" ජේන් කෙදිරිගෑවාය.බිල් එය පිරික්සා බැලුවේය. ඒ අතර ලූසි වට පිට බලන්නට විය.

" ඒක.....නෙවෙයි අනේ මගේ ටෝර්ච් නෑ" ලූසි ඇසුවාය.

" ළමයි......අපි ඉන්නේ ඊජිප්තුවේ"පීටර් කෑගැසුවේය. ජේන් ලූසි මුහුණට මුහුණ බැලුවෝය. " මොකක්............අපොයි ........නෑ......."

මෙතෙක් කියෙව්වාට ස්තූතියි…

ලෝක සවාරිය දෙක කොටස

## “ඊජිප්තු වික්‍රමය”

සමගින් එක්වෙමු…එතකන්

@ සතුටින් ඉන්න…සතුටින් කියවන්න
අන් අයව සතුටු කරන්න

# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විහවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශිය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දි තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධිකාරක,
සෙනෙවිරත්න මහලේකම්

ISBN 978-624-208-822-8